**ශීර්ෂ 313 - මධ්‍යම පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

මධ්‍යම පළාතේ අභිමානවත් ජනතාවට සෞභාග්‍යමත් ජීවිතයක් ලබාදීම ඉලක්ක කර ගනිමින් වසර 2016 වන විට ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පළාත් සභාව බවට පත් කිරීම.

1.2 මෙහෙවර

මධ්‍යම පළාතේ මුළු මහත් ජනතාවට උරුම සංස්කෘතික, සමාජ, ආර්ථික තත්ත්වයන් හා ස්වාභාවික පරිසරය රැකෙනා අයුරින් නවීන තාක්ෂණය භාවිතා කර මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් මධ්‍යම පළාත් ජනතාවට තිරසාර අභිමානවත්, උසස් ජීවන තත්ත්වයක් උදාකර දීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

මධ්‍යම පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.28,005,885,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.21,997,847,967 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.6,008,037,033 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 22,961,925,000 | 17,916,925,000 | 5,045,000,000 | 22 |
| මූලධන | 5,043,960,000 | 4,080,922,967 | 963,037,033 | 19 |
| එකතුව | 28,005,885,000 | 21,997,847,967 | 6,008,037,033 | 21 |

මධ්‍යම රජය විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.